Department of Education,Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**

විෂය ගිණුම්කරණය

සතිය- 2

ශ්‍රේණිය - 13


සකස් කළේ -H.A.W.N.ලක්මාලි ,ර/විද්‍යාරාජ වි.

නිපුනතාව 11 : මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිත කරයි.

නිපුනතා මට්ටම 11.2 : මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව විග්‍රහ කරයි.

**<u>පොදු පරමාර්ථ සඳහා මූලය වාර්තාකරණයේ අරමුණු</u>** .

වාර්තා කරන ඒකකයට දැනට සිටින සහ අපේක්ෂිත ආයෝජකයන්ට,ණය සපයන්නන්ට අනෙකුත් ණයහිමියන්ට එම ඒකකයට අදාළව සම්පත් සැපයීම පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය වන මූල්‍ය තොරතුරු සැපයීමයි.මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පදනම් කරගනු ලබන උපකල්පනය අඛණ්ඩ පැවැත්මයි.



<u>**මූල්‍ය ප්‍රකාශන වල මූලිකාංග**</u>

- වත්කම්
- වගකීම්
- ආදායම්
- වියදම්
- හිමිකම්

<u>**මූල්‍ය ප්‍රකාශන වල මූලිකාංග හඳුනා ගැනීම හා මැනීම**</u>

මූලිකාංග හඳුනා ගැනීමට පහත නිර්ණායක අදාළ කරගත යුතුය

- ❖ වත්කම් හෝ වගකීම් යන ඒවායේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ඕනෑම ආදායම්, වියදම් හෝ හිමිකම් වෙනස්වීම පිලිබඳ අදාළ තොරතුරු සැපයීම.
- ❖ වත්කම් හෝ වගකීමක සහ ඒවායේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ඕනෑම අදායම්, වියදම් හෝ හිමිකම් වෙනස්වීම පිලිබඳ විශ්වාසනීය නියෝජනය සිදුකිරීම.

හඳුනාගත් මූලිකාංගයන් මූල්‍ය ප්‍රකාෂන් තුල මැන දැක්වීමට භාවිතයට ගත හැකි පදනම්.

1. ඓතිහාසික පිරිවැය
2. ප්‍රවර්තන අගය
    a. සාධාරණ අගය
    b. ප්‍රයෝජ්‍ය අගය
    c. ප්‍රවර්තන පිරිවැය

<u>ගැටළු</u>

1. පොදු පරමාර්ථ මූලය ප්‍රකාශන වල අරමුණු සඳහන් කරන්න
2. මූලය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී පදනම් කරනු ලබන මූලික උපකල්පනය කුමක්ද?
3. වත්කමක ලක්ෂණ හා වගකීමක ලක්ෂණ සඳහන් කරන්න.
4. මූලය ප්‍රකාශන තොරතුරු වල ඇති මූලික ගුණාත්මක ලක්ෂණ 2 ක් හා වැඩිදියුණු කිරීමේ ගුණාත්මක ගතිලක්ෂණ 2 ක් සඳහන් කරන්න.
5. මූල්‍ය ප්‍රකාශන තුල ඇති මූලිකාංග හඳුනාගැනීම සඳහා සපුරාලියයුතු කොන්දේසි මොනවාද?
6. මූල්‍ය ප්‍රකාශන වල මූලික මිනුම් කිරීම් සඳහා යොදාගන්නා ක්‍රම 2 ක් සඳහන් කරන්න.